www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**2 වන දේශනය**

# "තනි රටක සමාජවාදය" සහ 1920 ගනන්වල සෝවියට් ආර්ථික විවාද — 2 වන කොටස

**"Socialism in One Country" and the Soviet economic debates of the 1920s—Part 1**

**නික් බීම්ස් විසිනි**

**2009 මැයි 7**

*ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්වරයා ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු ද වන නික් බීම්ස් 2007 අගෝස්තුවේ දී ඇමරිකා එක්සත් ජනපදයේ ඈන් ආබර් ප්‍රාන්තයේ මිචිගන්හි පැවැත්වුනු එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂ ගිම්හාන පාසලේ දී දේශන දෙකක් පැවැත්වී ය. මෙම දේශන ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳව සෝවියට් සංගමය තුල 1920 ගනන්වල දී පැන නැගුනු තීරනාත්මක ගැටුම් සමහරක් හා සම්බන්ධ ය. දේශන පැවැත්වීමෙහි ලා පෙලඹවූ එක් කරුනක් වූයේ 2006 දී ප්‍රකාශයට පත් කල ට්‍රොට්ස්කි නමැති සිය කෘතියෙන් බ්‍රිතාන්‍ය ශාස්ත්‍රඥයෙකු වන ජෙෆ්රි ස්වේන් පෙරට දැමූ විකෘත කිරීම්වලට පිලිතුරු දීමේ අවශ්‍යතාව යි. ඩේවිඩ් නෝර්ත්ගේ ලියොන් ට්‍රොට්ස්කි සහ ඓතිහාසික මුසාකරනය පිලිබඳ පශ්චාත් සෝවියට් ගුරුකුලය යන රචනයෙන් මේ පිලිබඳ තවත් කරුනු දත හැකි ය.*

*පහත පල වන්නේ "තනි රටක සමාජවාදය" පිලිබඳ ස්ටැලින්වාදී න්‍යාය ගැන පැවැත්වූ දෙවන දේශනයේ දෙවන කොටස යි.*

අවසානයේ විරුද්ධ පාර්ශ්වය පරාජය කොට ට්‍රොට්ස්කි පිටුවාහල් කරනු ලැබින. අවසන් විග්‍රහයේ දී, පරාජයේ මුල් විහිදී තිබුනේ මහජනතාවගේ ඉදිරි ගමනට බාධා කරමින් ජාත්‍යන්තර විප්ලවයට එරෙහිව තව දුරටත් එල්ල වූ ප්‍රහාරයන් තුල ය. මේ වතාවේ දී ඒවා සූදානම් කෙරුනේ ස්ටැලින්වාදී තන්ත්‍රයේ ම ප්‍රතිපත්තිවලිනි. පාලන තන්ත්‍රයන්ට අවශ්‍ය වූයේ හුදෙක් ජනතාව අකර්මන්‍ය කොට තැබීමයි.



**ලියොන් ට්‍රොට්ස්කි**

එහෙත් විරුද්ධ පාර්ශ්වයට අවශ්‍ය වූයේ ඔවුන් පිබිදීම සහ ක්‍රියාකාරීව සම්බන්ධ වීම යි. කෙසේ වුව ද, තව දුරටත් සිදු වූ පරාජයන්ගේ බලපෑම මධ්‍යයේ, විශේෂයෙන් ම 1926-27 චීන විප්ලවය පරාජයට පත් වූ තතු යටතේ ඒ තත්ත්වය වහා නොඑලඹියේ ය.

ට්‍රොට්ස්කි විරුද්ධ පාර්ශ්වයෙහි ප්‍රමුඛස්ථානය දැරූ අතර වාරයේ, එව්ජිනි ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි ආර්ථික ප්‍රතිපත්තිමය ක්ෂේත්‍රයෙහි අර්ථභාරී කාර්ය භාරයක් ඉටු කලේ ය. ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි ස්ටැලින් තන්ත්‍රයට යටත් වීමට නියමිත විය. එහෙත් ඔහුගේ විශ්ලේෂනයත්, එහි ගැබ් වන න්‍යායික සංකල්පත් තුල වැදගත් කාරනා අඩංගු ය. අවසානයේ දී තම මතවාදයන් ඉල්ලා අස් කර ගැනීමට ඔහු යොමු කෙරුනේ එම කාරනාවලින් ම වුව ද එමගින්, එහි අඩංගු වැදගත් කරුනුවල අදාලත්වය අංශු මාත්‍රයකින් වත් අහෝසිවී නැත.


13 වන සියවසේ දී මධ්‍යම රුසියාවෙහි

පිහිටුවන ලද කුඩා නගරයක් වූ බොල්බොව්හි දී ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි උපත ලද්දේ 1886 පෙබරවාරි 15 වන දා ය. 1937 ස්ටැලින්ගේ විරේක කිරීම්වල දී ඔහුට වෙඩි තබා මරා දමනු ලැබීන. රුසියානු මූලධර්මවාදී පල්ලියේ පූජකවරයෙකුගේ ද බයිබල් ගුරුවරියකගේ ද පුත්‍රයා වූ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි පසුව කියා සිටි පරිදි, ඔහුගේ තුරුනු රැඩිකල්වාදය ඔහු හාත්පස දක්නට තිබුනු "සකලවිධ ආගමික සටකපටකම්වලට" එරෙහිව වර්ධනය විය. ඔහු දේශපාලනික සටන්කරුවෙකු ලෙස මතු වී ආවේ උසස් පාසලේ සිටිය දී ය. පසුව එහි දී ම ඔහු දේශපාලනික වාර සඟරාවක් ද ආරම්භ කලේ ය. 1903 දී එනම් වයස 17 දී ඔහු රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමග එක් විය. මොස්කව් විශ්ව විද්‍යාලයීය නීති අංශයේ ශිෂ්‍යයෙකුව සිටි පලමු වසරේ දී ඔහු අත් අඩංගුවට ගනු ලැබිනි.

ඔහු 1905 විප්ලවයට සහභාගි වූයේ ය. එය මර්දනය කෙරුනු පසු යූරල් ප්‍රදේශයට ගිය ඔහු පින්ලන්තයෙහි පැවැත්වුනු සමස්ත රුසියානු පක්ෂ සම්මේලනයට සහභාගි වීම සඳහා තෝරා ගනු ලැබීන. ඔහුට ලෙනින් හමු වූයේ එහි දී ය. දේශපාලනික ක්‍රියාකාරකම් නිසා යලි යලිත් අත් අඩංගුවට පත් වූ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි 1909 සැප්තැම්බරයේ දී රට අභ්‍යන්තරයට පිටුවාහල් කරනු ලැබීන. පෙබරවාරි විප්ලවය පුපුරා යද්දී තාවකාලික ආන්ඩුවට සහාය නොදුන් ඔහු ලෙනින්ගේ අප්‍රේල් ප්‍රවාද පිලිගත් පලමු වැන්නන්ගෙන් කෙනෙක් විය.

1918 දී බ්‍රෙස්ට්-ලිටොව්ස්ක්හි සිදු වූ සාකච්ඡාවල දී ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි සිටියේ ගිවිසුමට විරුද්ධත්වය පල කලවුන් අතර ය. එහි දී ඔහු බුඛාරින් සමග සමීපව පෙල ගැසී ගත්තේ ය. 1917 දී මධ්‍යම කාරක සභාවේ විකල්ප සාමාජිකයෙකු ලෙස තෝරා පත් කර ගැනුනු ඔහු 1920 දී එහි පූර්න සාමාජිකයෙකු බවට පත් විය. ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි යුද කොමියුනිස්ට්වාදී කාල පරිච්ඡේදයේ දී මධ්‍යගත සැලසුම්කරනයක් වර්ධනය කිරීමට උත්සාහ කලවුන්ගෙන් අයෙක් විය. ආරම්භයේ සිට ම නව ආර්ථික ප්‍රතිපත්තියේ විවේචකයෙකු වූ ඔහු 1921 දෙසැම්බර් තරම් මුල දී ම යුද කොමියුනිස්ට්වාදය අත්වැරැද්දක් ලෙස විස්තර කිරීම ගැන ලෙනින් විවේචනයට ලක් කලේ ය.

1923 දී නිකුත් කෙරුනු 46 දෙනාගේ ප්‍රකාශනයට අත්සන් තැබූ අය අතර ප්‍රමුඛයෙකු වූ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි, නව ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසු දක්ෂිනාංශයේ ප්‍රධාන ප්‍රකාශකයා වූ බුඛාරින්ගේ න්‍යායන් සමග තියුනු සහ අඛන්ඩ ගැටුමක නිරත වූයේ ය. ස්ටැලින්වාදී තන්ත්‍රය වමට හැරී ඇති බවත් එය විරුද්ධ පාර්ශ්වය



එව්ජිනි ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි

ඉල්ලා සිටි කාර්මීකරන පියවරයන් ක්‍රියාත්මක කරමින් සිටින බවත් පවසමින් 1929 දී එනම් විරුද්ධ පාර්ශ්වය තලා දැමීමෙන් පසුව ට්‍රොට්ස්කිගෙන් මුලින් ම බිඳී වෙන් වූවන්ගෙන් ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි එක් අයෙක් විය.

*ධනවාදයේ පරිහානිය* නම් කෘතිය ප්‍රකාශයට පත් කිරීමත් සමග 1931 දී ඔහු යලිත් පක්ෂයෙන් නෙරපනු ලැබීන. එම කෘතියෙන් ස්ටැලින්ගේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥයා වූ වර්ගාගේ අදහස්වලට අර්ථහාරී ලෙස වෙනස් වූ අදහස් ප්‍රකාශයට පත් විය. 1932 දී ඔහු යලිත් පක්ෂයට ඇතුලත් කර ගැනින. 1934 දී පැවැත්වුනු ඊනියා "ජයග්‍රාහකයන්ගේ සම්මේලනයේ" දී, ඔහු සිය මතවාදයන් ඉල්ලා අස් කර ගත් අතර ට්‍රොට්ස්කිට ප්‍රහාරයක් ද එල්ල කලේ ය. 1935 දී අත් අඩංගුවට ගෙන සිරගත කිරීමෙන් පසුව ඔහු 1936 දී සිනොවියෙව්ට එරෙහි නඩුවේ දී පැමිනිල්ලේ සාක්ෂිකරුවෙකු ලෙස පෙනී සිටියේ ය. 1936 දී යලි අත් අඩංගුවට ගන්නා ලද ඔහුට එරෙහිව නඩු විභාගයක් කිරීමට නියමිතව තිබුනත් ඊට පෙනී නො සිටිමින් පාපොච්චාරනය කිරීම ප්‍රතික්ෂේප කල පසුව 1937 දී ඔහුට වෙඩි තබා මරා දමනු ලැබීන.

ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳ විවාදයට ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි කල ප්‍රධාන ප්‍රතිපදානය කේන්ද්‍රගත වූයේ ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනයේ න්‍යාය ලෙස ඔහු හැඳින්වූ දෙය වටා ය. සිය ලිපිවල ද 1926 දී ප්‍රකාශයට පත් කරන ලද *නවීන අර්ථශාස්ත්‍රය* නමැති සිය ප්‍රධාන කෘතියෙහි ද එය විස්තාරනය කොට තිබීන.

නව ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාත්මක වන සෝවියට් ආර්ථිකය තුල ධනවාදී වෙලඳ පොල නියාමනය කරන වටිනාකම පිලිබඳ න්‍යාය සහ ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනයේ න්‍යාය අතර ගැටුමක්

පවතින්නේ යැයි ඔහු කියා සිටියේ ය. ඒ අනුව, සෝවියට් ආර්ථිකයේ සමතුලිතතාව තහවුරු කෙරුනේ "[මෙම] ප්‍රතිවාදී න්‍යායන් දෙක අතර ගැටුම පදනම් කර ගනිමිනි." [24]

ප්‍රාථමික වූ සමුච්චකරනයේ සංකල්පය උකහා ගන්නා ලද්දේ ධනවාදයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ මාක්ස්ගේ විශ්ලේෂනයෙනි. වෙලඳ පොලේ ස්වයංසිද්ධ ක්‍රියාකාරිත්වය තුලින් මුල් කාලීන සකලවිධ නිෂ්පාදන විධි අතු ගා දැමිය හැකි අවධිය කරා වර්ධනය වන්නට කලින් ප්‍රාරම්භක ධන සමුච්චගත කිරීමක් ඇති කර ගන්නට ධනපති ක්‍රමයට සිදු විය. මෙම ප්‍රාථමික වූ සමුච්චකරනය සාක්ෂාත් කර ගැනුනේ විජිතවාදී ප්‍රතිපත්තියෙන්, ගොවි නිෂ්පාදනය කොල්ල කෑමෙන්, බදු යොදා ගැනීමෙන් සහ සියල්ලට මත් වඩා රාජ්‍ය බලය උපයෝගි කර ගැනීමෙනි.

සමාජවාදී නිෂ්පාදනය පූර්න වශයෙන් වර්ධනය වූ විට එය ධනවාදය අභිභවා යන උත්තරීතර බවක් අත් කර ගනු ඇත. එහෙත් සෝවියට් සංගමය තුල පසුගාමී ආර්ථිකයක් පැවති මේ මොහොතේ දී එය පැවතුනේ බොහෝ පසුපසින් ගාටමිනි. කාලය ගත වෙද්දී, සමාජවාදී ආර්ථිකය තුලින් නිර්මානය කර ගැනෙන සම්පත්වලින් නිෂ්පාදන මාධ්‍ය ගොඩ නගා ගැනීමෙන් සමාජවාදී සමුච්චගත කිරීම සාක්ෂාත් කර ගත හැකි වනු ඇත. එහෙත් ඒ අවධියට ලඟා වී තිබුනේ නැත. "ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනයේ" යෙදී ගැනීම අත්‍යවශ්‍ය විය. මෙහි අඩංගු වූයේ "රාජ්‍ය ආර්ථික ආයතනවලින් පිටස්තරව පවතින ද්‍රව්‍යමය සම්පත්වලින් බොහොමයක් හෝ කොටසක් රාජ්‍යයේ අත යට සමුච්චගත කර ගැනීම" යි. "පසුගාමී ගොවිජන රටක දී මෙම සමුච්චගත කිරීම අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට නියමිත ය. එය රාජ්‍ය ආර්ථිකය තාක්ෂනිකව සහ විද්‍යාත්මකව යලි ගොඩ නැඟීම ආරම්භ වන සහ අවසානයේ දී එම ආර්ථිකය ධනවාදය අභිභවා ආර්ථිකමය උත්තරීතර බව අත් කර ගන්නා මොහොත බොහෝ කඩිනමින් ලඟා කර දෙනු ඇත." [25]

තමන් ධනවාදය යටතේ ප්‍රාථමික සමුච්චගත කිරීම සාක්ෂාත් කර ගෙන සිටි ගොවි ජනතාවට එරෙහිව කර්කශ ස්වරූපයේ පියවරයන් යෝජනා කරන්නේ යැයි සිය දක්ෂිනාංශික විරුද්ධවාදීන් කල ප්‍රකාශ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි ප්‍රතික්ෂේප කලේ ය. සමුච්චගත කිරීමේ ක්‍රියා දාමය සිදු වනු ඇත්තේ මිල යාන්ත්‍රනය හරහා බව ඔහු අවධාරනය කලේ ය.

ඔහු පහත උදාහරනය යොදා ගනිමින් කාරනා පැහැදිලි කලේ ය.

| කර්මාන්ත | | කෘෂිකර්මය | |
|---|---|---|---|
| ශ්‍රම පැය | 100 යි | ශ්‍රම පැය | 150 යි |
| ඒකක | 100 යි | ඒකක | 100 යි |
| රූබල් | 100 යි | රූබල් | 100 යි |

කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ නිෂ්පාදනවලට ඇත්තේ එක ම මිලකි. අසමානතාව පවතින්නේ කෘෂිකාර්මික ශ්‍රම පැය 150ක් අඩංගු කර ගත් ධාන්‍ය හුවමාරු වී ඇත්තේ කාර්මික ශ්‍රම පැය 100ක් පමනක් අඩංගු කර ගත් කාර්මික භාන්ඩ ප්‍රමානයකට ය කරුනෙහි ය. ලෝක ආර්ථිකය තුල දී නම් කෘෂිකාර්මික ශ්‍රම පැය 150ක් අඩංගු කර ගත් ධාන්‍ය ඊට වඩා බෙහෙවින් වැඩි කාර්මික භාන්ඩ ප්‍රමානයකට හුවමාරු කර ගත හැකි වෙතැයි උපකල්පනය කිරීමට පුලුවන් විය හැකි ය. එහෙත් විදේශ වෙලඳාමේ ඒකාධිකාරය නිසා මෙය වැලකී යයි. අසමාන හුවමාරුව හුවමාරු සබඳතාවන්හි වෙනසකට තුඩු දෙන පරිදි ශ්‍රමයේ ඵලදායිතාව ඉහල නංවමින් නව උපකරනවල සහ යන්ත්‍රසූත්‍රවල ස්වරූපයෙන් සමාජවාදී කාර්මික අංශය සිදු කරන සමුච්චගත කිරීමට පදනම සපයයි.

| කර්මාන්ත | | කෘෂිකර්මය | |
|---|---|---|---|
| ශ්‍රම පැය | 100 යි | ශ්‍රම පැය | 150 යි |
| ඒකක | 120 යි | ඒකක | 100 යි |
| රූබල් | 100 යි | රූබල් | 100 යි |

දෙවන අවිධයේ දී, හුවමාරුව තව මත් අසමාන වන නමුත් ගොවි ජනතාවගේ තත්ත්වය වැඩි දියුනු වී ඇත. කලින් ලැබුනු ඒකක 100ට සංසන්දනාත්මකව දැන් ඔවුහු කාර්මික භාන්ඩ ඒකක 120ක් ලබති. ගොවි ජනතාවගෙන් අතිරික්තය ඩැහැ ගැනීම නිසා "යම් අතෘප්තියක් හට ගනු" ඇති බව ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි පිලිගත්තේ ය. එහෙත් ඒ අතර ම එම ප්‍රතිපත්තිය මෙම අතෘප්තිය යටපත් කිරීමට අවශ්‍ය කොන්දේසි නිර්මානය කිරීම ද අරඹනු ඇත. ඒ කාර්මික නිෂ්පාදනය පුලුල් කිරීමෙන් සහ මිල ගනන් පහත හෙලීමෙනි; ඒ අනුව වෙලඳුන් විසින් ගොවීන් සූරා කෑම අඩු කිරීමෙන් සහ ගම්බද ප්‍රදේශවලින් නව කම්කරුවන් බඳවා ගැනීමට අවස්ථාව සැලසීම ද සිදුවෙයි. අනෙක් අතකින් බලන විට, ඌන සමුච්චගත කිරීම නොකඩවා පෙරට යාම නිසා "ගම්බදින් එන මෙම පීඩනය අපගේ ආරක්ෂනවාදී පද්ධතියට ද විදේශ වෙලඳාමේ ඒකාධිකාරයට ද තර්ජනය කරමින්" අඛන්ඩ "භාන්ඩ අහේනියකටත්" ගොවීන්ගේ අතෘප්තිය නැගීමකටත් මග පෑදී ය. [26]

මෙම ක්‍රියා දාමයේ යන්ත්‍රනයන් විස්තර කිරීමට ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි මනාප වූයේ නැත. ඔහු උත්සාහ කලේ ඒවා පාලනය කල වෛෂයික නියාම යැයි තමන් විශ්වාස කල දේ සොයා ගන්නට ය. ආර්ථිකය දුවවනු

ලැබෙන්නේ රාජ්‍යයසතු නිෂ්පාදන මාධ්‍ය වර්ධනය කිරීම සඳහා වන අරගලයෙනි; ඉන් අර්ථවත් වන්නේ ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනය උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා දරන පරිශ්‍රමය යි.

"ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනය උපරිම ලෙස වර්ධනය කිරීම කරා යොමු වූ සවිඥානක සහ අර්ධ සවිඥානක ප්‍රවනතා සියල්ල ඒකරාශි වීම, ආර්ථික අවශ්‍යතාව ද සමස්ත පද්ධතියේ පැවැත්මට සහ වර්ධනයට බලපාන නියාමය ද වන්නේ ය; එමෙන් ම, දෙන ලද තත්ත්වයක දී ප්‍රශස්ත සමුච්චකරනය කරා ලඟා වීමට මග පෑදෙන ක්‍රියාවන්හි යලි යලිත් යෙදී ගැනීම සඳහා රාජ්‍ය ආර්ථිකය තුල සිටින නිෂ්පාදකයන් සියලු දෙනාගේ ම සවිඥානකත්වය යොමු කරන නියත පීඩනය ද වන්නේ ය." [27]

අප ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි ස්ටැලින්ට යටත් වීම කෙරෙහි බලපෑ හේතු සලකා බලන විට, සවිඥානකත්වය මත පීඩනය යොදන ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනයේ න්‍යායෙහි වෛෂයික ස්වභාවය පිලිබඳව කෙරෙන මෙම අවධාරනය අර්ථභාරී ය.

හුදෙක් සමාජවාදී සැලසුම්කරන මූලධර්මය සහ වෙලඳ භාන්ඩ ආර්ථිකයේ ස්වයංසිද්ධතාව අතර අරගලය පිලිබඳව කතා කිරීම පමනක් ප්‍රමානවත් නොවන බව ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි අවධාරනය කලේ ය. මන්ද, එයින් එම අරගලයේ විශේෂිත අවධිය සහ එය වර්ධනය වෙමින් පවතින්නේ කවර කොන්දේසි යටතේ ද යන්න ගැන කිසිවක් නොපැවසෙන බැවිනි.

එමෙන් ම, ප්‍රාථමික වූ සමාජවාදී සමුච්චකරනයේ න්‍යාය පදනම් වූයේ, ධනවාදයේ ම වර්ධනය තුල පැවති වටිනාකම පිලිබඳ න්‍යායේ ක්‍රියාකාරිත්වයට යටි වල කැපූ එම ප්‍රවනතා මතම යැයි ද ඔහු කියා සිටියේ ය. මෙම විශ්ලේෂනය අවසානයේ දී වාම විරුද්ධ පාර්ශ්වයෙන් සහ ට්‍රොට්ස්කිගෙන් බිඳී වෙන් වීම සඳහා පදනම සැකසූ බැවින්, මේ හා බැඳී ඇති මාක්ස්වාදී දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ මූලික ප්‍රශ්න, විශේෂයෙන් ම වටිනාකම පිලිබඳ න්‍යාය විස්තාරනය කිරීම මෙහි ලා අත්‍යවශ්‍ය වේ.

ඕනෑ ම වෙලඳ භාන්ඩයක වටිනාකම තීරනය වන්නේ ඒ තුල අඩංගු වන සමාජමය වශයෙන් අවශ්‍ය වන ශ්‍රම ප්‍රමානයෙන් බව ප්‍රාග්ධනයේ 1 වන වෙලුමේ දී මාක්ස් පෙන්නුම් කලේය. සරල වෙලඳ භාන්ඩ සමාජයක — මෙය මාක්ස් යොදා ගත් න්‍යායික වියුක්තනයකි — වෙලඳ පොලේ දී වෙලඳ භාන්ඩ හුවමාරු වන්නේ, ඒවායේ වටිනාකම් අනුව ය. වැටුප් කොන්ත්‍රාත්තුවේ දී කම්කරුවා ධනපතියාට විකුනන ශ්‍රම ශක්තිය නමැති වෙලඳ භාන්ඩය මිල දී ගෙන පරිභරනය කිරීමෙන්, අතිරික්ත වටිනාකම උපදින සැටි මෙම විශ්ලේෂනය පදනම් කර ගනිමින් මාක්ස් පෙන්වා දෙයි. වෙලඳ භාන්ඩ හුවමාරුව පාලනය වන නියාමයන්ගෙන් ම අතිරික්ත වටිනාකම උපදින බවත් ශ්‍රම ශක්තිය මිල දී ගැනීම සහ විකිනීම සිදු වනවාත් සමග ම එය මතු වී එන බවත් මාක්ස් පෙන්වා දෙයි. අතිරික්ත වටිනාකමේ මූලාරම්භය පවතින්නේ, ශ්‍රම ශක්තිය විශේෂ වෙලඳ භාන්ඩයක් ය, නිෂ්පාදන ක්‍රියාවලියේ දී එය වැය කිරීමෙන්, ඒ තුල අඩංගු වනවාට වඩා වැඩි වටිනාකමක් එය මඟින් උපදවන්නේ ය යන කරුන තුල ය.

මාක්ස්ගේ විශ්ලේෂන විධික්‍රමයෙහි වියුක්තයේ සිට සංයුක්තය දක්වා අඛන්ඩව සිදු වන චලනයක් අන්තර්ගත ය. ප්‍රාග්ධනයේ 3 වන වෙලුමේ දී, සරල භාන්ඩ හුවමාරුව වෙනුවට අපට හමුවන්නේ, ධනපති සමාගම්වල නිෂ්පාදනයෝ ය. එහි දී සජීවී ශ්‍රමයට, නිෂ්පාදන මාධ්‍යයන්ගේ [ස්ථාවර ප්‍රාග්ධනය] අනුපාතයන්, කර්මාන්තයෙන් කර්මාන්තයට ඇති පරිමානය අනුව වෙනස් වෙයි.

දැන් තව දුරටත් වෙලඳ භාන්ඩය තනි පුද්ගල නිෂ්පාදකයෙකුගේ නොව, ධනපති සමාගමක නිෂ්පාදනයක් වන අතර, එහි මිල තීරනය වනු ඇත්තේ ඒ තුල අඩංගු වන නව ශ්‍රම ප්‍රමානය අනුව සෘජුව නොව, එය නිෂ්පාදනය කිරීම සඳහා වැය කල මුලු ප්‍රාග්ධනය උදෙසා ලැබෙන ප්‍රතිලාභයක් වැනි සාමාන්‍ය ලාභ අනුපාතිකයකිනි. සමස්තයක් ලෙස සමාජයේ මෙම සාමාන්‍ය අනුපාතිකය තීරනය වන්නේ, යෙදවූ මුලු ප්‍රාග්ධනය කම්කරු පන්තියෙන් උකහා ගත් මුලු අතිරික්ත වටිනාකමට දක්වන සබඳතාව තුලින්ය.

තරගය යනු පවතින අතිරික්ත වටිනාකම් ස්කන්ධයේ තම පංගුව අයත් කර ගැනීම සඳහා ප්‍රාග්ධනයේ විවිධ අංශ අතර ඇති වන අරගලයේ රූපාකාරය බව මෙම විශ්ලේෂනය පදනම් කර ගනිමින් මාක්ස් පෙන්නුම් කරයි. ආර්ථිකයේ එක් අංශයක පවතින මිල ගනන් එම අංශය තුල පවතින ප්‍රාග්ධනය උදෙසා සාමාන්‍ය අනුපාතිකයට වඩා වැඩි ලාභයක් ගෙන දෙන මට්ටමක පවතින්නේ නම්, අනෙකුත් අංශවල ප්‍රාග්ධනය එතැනට ගලාවිත්, නිෂ්පාදනය වැඩි කොට, ලාභ අනුපාතිකයන් යලිත් සාමාන්‍ය මට්ටම්වලට ලඟා වන තෙක් මිල පහත දමයි. කෙසේ වුව ද, එම අංශය තුල දැනට මත් පවතින සමාගම්, නව ප්‍රාග්ධනය ඇතුලු වීම වැලැක්වීමට සමත් වන්නේ නම්, එනම් මොන යම් හේතුවක් නිසා හෝ ඒකාධිකාරී පාලනයක් පවත්වා ගෙන යාමට ඔවුන් සමත් වන්නේ නම්, එවිට එම අංශයෙහි ලාභ, සාමාන්‍ය අනුපාතිකයට වඩා ඉහලින් පවතිනු ඇත. සමස්ත අතිරික්ත වටිනාකම

වැඩි නොවනු ඇති නමුත්, එය බෙදා හැරෙනු ඇත්තේ වෙනස් ආකාරයකට ය. ඒකාධිකාරී ධනපති කර්මාන්ත අංශ වඩා තරගකාරී අංශවල වියදමින් ප්‍රතිලාභ භුක්ති විඳිනු ඇත.

වටිනාකම පිලිබඳ නියාමයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි ඒකාධිකාරය කරන බලපෑම පිලිබඳ මාක්ස්ගේ විශ්ලේෂනය, දේශීය වෙලඳ පොලෙහි තරග වැද සිටින ගොවි නිෂ්පාදකයන් හමුවේ යෝධ සංගතයක් හෝ ඒකාධිකාරයක් ලෙස ක්‍රියාත්මක වන සෝවියට් ආර්ථිකය සඳහා සමීපව යොදාගත හැකි වෙතැයි ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි විශ්වාස කලේ ය. එමෙන් ම, සමස්තයක් ලෙස සෝවියට් ආර්ථිකයම ක්‍රියාත්මක වූයේ, යෝධ භාරකාරත්වයන් සහ ඒකාධිකාරී සංගත වැඩි වැඩියෙන් ආධිපත්‍යය දරන ලෝක වෙලඳ පොලක් තුල ක්‍රියාත්මක වන, ඒකාධිකාරයක් හැටියට ය.

කම්කරු පන්තියේ රාජ්‍ය ආර්ථිකය ඓතිහාසිකව පැන නැඟී තිබුනේ, ඒකාධිකාරී ධනවාදයේ පදනම මත යැයි ඔහු ලීවී ය. මෙය ජාතික කර්මාන්තයේ දේශීය වෙලඳ පොල තුල, ඒකාධිකාරී මිල ගනන් ඇති වීමටත්, සුලු නිෂ්පාදනය සූරා කෑමට සහ අතිරික්ත ලාභය පැහැර ගැනීමටත් මග පෑදී ය. ප්‍රාරම්භක සමාජවාදී සමුච්චයේ කාල පරිච්ඡේදය තුල, මිල ප්‍රතිපත්තියේ පදනම සකස් කලේ මෙම තත්ත්වය යි. කම්කරු රාජ්‍යයේ පාලනය යටතේ පවතින තනි රාජ්‍ය භාරකාරත්වයක් අතෙහි තව දුරටත් කර්මාන්ත සංකේන්ද්‍රනය වීම නිසා, "ඒකාධිකාරය පදනම් කර ගනිමින්, පෞද්ගලික ආර්ථිකය තුල බදු අය කිරීමේ තවත් රූපාකාරයක් පමනක් වනු ඇති මිල ප්‍රතිපත්තියක් ගෙනයාමේ හැකියාව ඉමහත් ලෙස වැඩි වේ." [28]

එහෙත්, ඒකාධිකාරී ධනවාදයේ වර්ධනයත් සමග, වෙලඳ භාන්ඩ නිෂ්පාදනය හා සම්බන්ධ අනෙකුත් සියලු නියාමයන් සමගින්" වටිනාකම පිලිබඳ නියාමය ද අඩු ගනනේ "පාර්ශ්වීය වශයෙන් වත් අහෝසි කර දමා ඇතැ"යි අවධාරනය කරමින් ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි තවත් ඉදිරියට ගමන් කලේ ය. [29]

නිදහස් තරගය ජාතික වෙලෙඳ පොලවල් තුල අහෝසිකර ඇතුවා පමනක් නොව, ලෝක වෙලඳ පොල තුල ද එය වඩ වඩාත් තුරන් වෙමින් පැවතින. යෝධ භාරකාරත්වයන්, විශේෂයෙන් ම එක්සත් ජනපදය තුලින් මතු වී ආ, ලෝක වෙලඳ පොල තුල වැඩිවන ආධිපත්‍යයක් හිමි කර ගනිමින් තිබුනි. "සුවිශේෂී ධනපති සමාගම්වල වැඩවසම් රාජධානි, නැත්නම් සංවෘත ලෝකයන් බවට පරිවර්තනය" වුනු, විශ්වසනීයත්වයෙන් බැඳුනු නිෂ්පාදන ශාඛාවන් අතර ලාභ අනුපාතිකය සමානකරනය කිරීම — වටිනාකම පිලිබඳ නියාමය ක්‍රියාත්මක වන්නේ මෙම යන්ත්‍රනය හරහා ය — කල නොහැකි දෙයක් බවට ම පත්ව තිබින. [30]

මෙහි දී අපට ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ සහ ට්‍රොට්ස්කිගේ ප්‍රවිෂ්ටයන්හි වෙනස්කම් මතුවනු දැකිය හැකි ය. 1926 මැයි මාසයේ දී සකස් කරන ලද (notes on economic questios) "ආර්ථික ප්‍රශ්න පිලිබඳ සටහන්" නමැති සිය ලියවිල්ලේ දී ට්‍රොට්ස්කි ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ විශ්ලේෂනයෙහි ගැබ් වන ඇතැම් අන්තරායන් පෙන්වා දුන්නේ ය.

ඔහු මෙසේ ලිවී යː "වටිනාකම පිලිබඳ නියාමය සහ සමාජවාදී සමුච්චයකරනය පිලිබඳ නියාමය අතර පවතින (විසංවාදී සහ සුසංවාදී යන දෙයාකාරයේ ම) අන්තර් ක්‍රියාකාරිත්වය පදනම් කර ගනිමින් අපගේ ආර්ථිකය විශ්ලේෂනය කිරීම වනාහි, මූලධර්මාත්මකව ගත් කල අතිශයින් ම සාරවත් ප්‍රවිෂ්ටයකි — වඩාත් නිශ්චිතව කිව හොත්, නිවැරදි වන එක ම දෙය යි. එවැනි විශ්ලේෂනයක් පටන්ගත යුත්තේ, කොටු වුනු සෝවියට් ආර්ථිකයේ රාමුව තුල හිඳිමිනි. එහෙත් දැන් මෙම විධික්‍රමාන්විත ප්‍රවිෂ්ටය, 'තනි රටක් තුල සමාජවාදය ගොඩනැඟීමට' බලාපොරොත්තු වන, දී ඇති ආර්ථික ඉදිරි දර්ශනයක් බවට පත් වීමේ අන්තරායක් වැඩෙමින් තිබේ. මෙතෙක් වැරදියට වටහා ගත් ලෙනින්ගේ උද්ධෘත පාඨයක් මත පදනම්ව සිටි මෙම දර්ශනවාදයේ ආධාරකරුවන්, ඉහත කී විධික්‍රමාන්විත ප්‍රවිෂ්ටය ස්වායත්ත යැයි ආසන්න වශයෙන් පෙනී යන ක්‍රියා දාමයක් සඳහා වූ සාමාන්‍යකරනයක් බවට හරවමින්, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ විශ්ලේෂනය සීරුමාරු කිරීමට උත්සාහ දරනු ඇතැයි අපේක්ෂා කරන්නට, බිය වන්නට හේතු පවතියි. චෞරත්වයේ ද මුසාකරනයේ ද මේ වර්ගයේ උත්සාහයන් කවර වියදමක් දරා හෝ කල්තියාම අතුගා දැමීම අත්‍යවශ්‍ය ය. වටිනාකම පිලිබඳ නියාමය සහ සමාජවාදී සමුච්චකරනයේ නියාමය අතර අන්තර් ක්‍රියාකාරිත්වය, ලෝක ආර්ථිකයේ සන්දර්භය තුල පිහිටුවිය යුතු ය. එවිට, ලෝක වෙලඳ පොලේ ආධිපත්‍යය දරන හා, කිසි කලෙකත් නොවූ තරම් බලවත් වෙමින් තිබෙන, වටිනාකම පිලිබඳ නියාමයෙන් එල්ල වන වැඩෙන බාහිර පීඩනයෙන්, නව ආර්ථික ප්‍රතිපත්තියේ සීමිත රාමුව තුල ක්‍රියාත්මක වන වටිනාකම පිලිබඳ නියාමය ඌනපූරනය වන බව පැහැදිලි වනු ඇත." [31]

1927 ජනවාරියේ දී ට්‍රොට්ස්කි මෙම කාරනය වෙත යලි එලඹියේ යː "අපි ලෝක ආර්ථිකයේ කොටසක් වන අතර ධනවාදයෙන් වට කරනු ලැබ සිටින්නෙමු. මෙයින් අදහස් වන්නේ, සමාජවාදී සමුච්චයකරනය පිලිබඳ 'අපගේ' නියාමය සමග වටිනාකම පිලිබඳ 'අපගේ' නියාමය එකට වෙලී පවතින බවයි. ඒ, නියාමයන් දෙක අතර පවතින

බලවේගයන්ගේ සබඳතාව බැරෑරුම්ව වෙනස් කරන්නේ ... වටිනාකම පිලිබඳ ලෝක නියාමය මඟින් ය." [32]

සෝවියට් සංගමය තුල පවත්නා කර්මාන්ත වර්ධනය කල යුත්තේ ජාත්‍යන්තර ශ්‍රම විභජනයට අනුකූලව යැයි ට්‍රොට්ස්කි දිගටම කියා සිටියේ ය. එනම් සෝවියට් සංගමයේ ආර්ථික ව්‍යුහය සහ කම්කරු පන්තිය බලය ගත් පසු යුරෝපයේ සෙසු රටවල වර්ධනය වන ව්‍යුහය අතර "අගාධයක්" නො පවතියි. ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිට තිබුනේ වෙනස් සංකල්පයකි. යුරෝපයේ දී කම්කරු පන්ති විප්ලවය ජය ගත හොත් ආර්ථිකය සංවිධානය කිරීමේ විධික්‍රමය හැටියට සැලසුම්කරන මූලධර්මය ජය ගනු ඇතිවා පමනක් නොව, "ශ්‍රමයේ සහ නිෂ්පාදන මාධ්‍යවල සමානුපාතය ද සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත." [33]

වර්ධනය කල යුත්තේ කිනම් කර්මාන්ත ද යන කාරනය තෙක් ම මෙම වෙනස්කම් පැතිර ගියේ ය. පූර්ව යුද්ධ කාල පරිච්ඡේදයේ දී රුසියාවේ තාක්ෂනික උපකරන අවශ්‍යතාවලින් තුනෙන් දෙකක් පමන ම ආනයනය කෙරුනු බවත් දේශීය නිෂ්පාදනවලින් සැපිරුනේ අවශ්‍යතාවලින් තුනෙන් එකක් පමනක් බවත් එමෙන් ම එම තුනෙන් එක පවා සමන්විත වූයේ ඉතා ම සරල යන්ත්‍රවලින් බවත් ට්‍රොට්ස්කි බොහෝ අවස්ථාවල දී පෙන්වා දුන්නේ ය. වඩාත් සංකීර්න වූ ද වඩාත් වැදගත් වූ ද යන්ත්‍ර විදේශවලින් ගෙන්වා ගන්නා ලදි. වෙනත් වචනවලින් කිව හොත්, ආර්ථික ප්‍රතිපත්තිය පූර්ව යුද්ධ කාලීන ජාත්‍යන්තර ශ්‍රම විභජනය ගැන සැලකිලිමත් විය යුතුව තිබින.

ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ විශ්ලේෂනය ගමන් කලේ වෙනත් දිසාවකට ය. මිල දී ගැනීමේදී ද නිෂ්පාදනයේදී ද රාජ්‍ය ඒකාධිකාරය පවතින තත්ත්වය තුල, නිෂ්පාදන මාධ්‍ය නිපදවීමේ ක්ෂේත්‍රය තුල දී වටිනාකම පිලිබඳ නියාමය බලපෑවේ ඉතා අඩුවෙන් යැයි ඔහු දිගටම කියා සිටියේ ය. "මින් අදහස් වන්නේ අපගේ සමාජවාදී ආර්ථික ක්‍රමය තුල පවතින වඩාත් ම සමාජවාදී පුරුක වන්නේ බැර කර්මාන්තය බව යි. එනම් ඒකාබද්ධ රාජ්‍ය ආර්ථික යන්ත්‍රනයක් සහිත ශක්තිමත්, සැලසුම්ගත ඇනවුම් කිරීමේ සහ ස්ථාවර මිල ගනන්වලින් සමන්විත ක්‍රමයකින් වෙලඳ පොල සබඳතා ආදේශ කිරීමේ ක්‍රියාවලියේ දී, වැඩි දුරටත් ප්‍රගතියක් අත් කර ගෙන ඇති පුරුක එය බව යි." [34]

සැබවින් ම, මෙම ක්ෂේත්‍රයේ දී තරම් වෙන මොන ම ක්ෂේත්‍රයක් දී වත් වටිනාකම පිලිබඳ නියාමය සහ ජාත්‍යන්තර ශ්‍රම විභජනය තව දුරටත් නො සලකා හැරිය නොහැකි විය. නිෂ්පාදන මාධ්‍ය නිපදවීම හෙවත් බැර කර්මාන්තයෙන් අදහස් වූයේ, උදාහරනයක් ලෙස, ලුහු කර්මාන්ත සහ රෙදිපිලි නිෂ්පාදනය වැනි ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍රවලින් ඉවතට හරවා යැවෙන සම්පත් සහිත විශාල ප්‍රාග්ධන ප්‍රමානයක්, දීර්ඝ කාල පරිච්ඡේදයක් තිස්සේ ඊට අනුරූපී වන ආකාරයෙන් එයට ගැටගසා තැබෙන බව යි. එයට ඉදිරියට යා හැකිව තිබුනේ නම්, මෙම ක්ෂේත්‍රවල වැඩි වූ නිෂ්පාදනයේ ප්‍රතිඵලයක් ලෙස වෙලඳ පොලට වඩා විශාල ධාන්‍ය ප්‍රමානයක් ගලා ඒමට හැකියාව තිබුනු අතර, ගොවීන්ට ඔවුන් මිල දී ගැනීමට අදහස් කරන භාන්ඩ වැඩි ප්‍රමානයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, ලෝක වෙලඳ පොල තුල වැඩි ධාන්‍ය ප්‍රමානයක් විකිනීමට ද වැඩි වූ අපනයන ආදායම යොදා ගනිමින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනවාට වඩා අඩු වියදමකින් සහ වඩා හොඳ තත්ත්වයකින් යුතු, අවශ්‍ය ප්‍රාග්ධන භාන්ඩ මිල දී ගැනීමට ද රාජ්‍යයට හැකියාව ලැබෙනු ඇත. වෙනත් වචනවලින් කිව හොත්, කිසි යම් ප්‍රාග්ධන උපකරනයක් නිෂ්පාදනය කිරීම සඳහා පියවර ගන්නවා ද නැද්ද යන්න පිලිබඳ තීරනය රඳා පැවතුනේ හුදෙක් එම කර්මාන්තය තුල පැවති සබඳතා මත පමනක් නොව, සමස්ත සෝවියට් ආර්ථිකය තුල ද වඩාත් පොදුවේ කිව හොත් ලෝක වෙලඳ පොල තුල පැවති සබඳතා ද මත ය.

සහන ප්‍රතිපත්තිය, එනම් සෝවියට් ආර්ථිකය ජාත්‍යන්තර පෞද්ගලික ආයෝජනයන්ට විවෘත කිරීම සම්බන්ධයෙන් ද මෙම වෙනස්කම් ම මතු විය. ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි සහන දීම්වලින් මතු වන අන්තරායන් ගැන අනතුරු ඇඟවූ අතරවාරයේ ට්‍රොට්ස්කි පවත්නා ප්‍රතිපත්තිය ලිහිල් කිරීම වෙනුවෙන් පෙනී සිටියේ ය. 1925 ජුලි මාසයේ දී ජර්මානු කම්කරු නියෝජිත කන්ඩායමකට ඔහු පැවසුවේ, ආරම්භක අවධියේ සෝවියට් බලධාරීහු බෙහෙවින් පරිස්සම් සහගත වූ බව යි, යමෙකුට එය පමනට වැඩි පරිස්සම් සහගත වීමකැයි පවා කිව හැකි වූ බව යිඃ

"අපි ඉතා දිලිඳු ද දුබල ද වීමු. අපගේ කර්මාන්ත ද අපගේ මුලු මහත් ආර්ථිකය ම ද දැඩි ලෙස විනාශයට පත්ව තිබුනු අතර, විදේශ ප්‍රාග්ධනය හඳුන්වා දීමෙන් තව මත් දුර්වල අඩියක පැවති සමාජවාදී කර්මාන්තවල පදනම් වලට හානි වනු ඇතැයි අපි බියට පත් වුනෙමු ... තාක්ෂනික අර්ථයෙන් ගත් විට අප තව මත් බෙහෙවින් පසුගාමී ය. අපගේ තාක්ෂනික ප්‍රගතිය වේගවත් කිරීම සඳහා හැකි සෑම මාධ්‍යයක් ම ප්‍රයෝජනයට ගැනීමට අපි උත්සුක වන්නෙමු. සහන දීම යනු මෙය කල හැකි එක් ක්‍රමයකි. අපගේ ආර්ථික ස්ථාවර භාවය තිබියදීම, නැත් නම් වඩාත් නිශ්චිතව කිව හොත් අපගේ ආර්ථික ස්ථාවර භාවය නිසා, වසර කිහිපයකට පෙර දීට වඩා, අපගේ නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීමෙහි ලා සහභාගි වීම වෙනුවෙන්,

විදේශීය ධනපතියන්ට සැලකිය යුතු මුදල් ප්‍රමානයක් ගෙවන්නට අප දැන් වැඩියෙන් නැඹුරු වන්නෙමු." [35]

ට්‍රොට්ස්කි එක් අවස්ථාවක මෙසේ ඇසී යː වඩා හොඳ කුමක් ද? බාල හා වියදම්කාරී ටර්බයිනයකින් කෙරෙන ස්වාධීන නිෂ්පාදනය ද, නැත්නම් වඩා හොඳ ටර්බයිනයකින් කෙරෙන පරාධීන නිෂ්පාදනය ද?

බොහෝ දුරකට, තමන්ගේ ප්‍රතිපත්ති නිසා හට ගත් ධාන්‍ය සැපයුම පිලිබඳ අර්බුදයට ප්‍රතිචාර වශයෙන්, 1928 අග දී ස්ටැලින් නායකත්වය සැලසුම්කරනය සහ කාර්මීකරනය දෙසට හැරුනු විට, විරුද්ධ පාර්ශ්වයෙන් ඉවත් වී ගිය පලමු වැන්නන්ගෙන් එක් අයෙකු වූයේ, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි ය. 1929 අප්‍රේල්වල දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ යː "විරුද්ධ පාර්ශ්වය විස්තර කල පරිදි, පහලොස් වන සමුලුවෙන් පසුව පක්ෂ ප්‍රතිපත්තිය දකුනට තල්ලු නොවූයේ ය යන මූලික වූත් පරිපූර්න වූත් නිගමනයට එලඹෙන්නට කෙනෙකුට සිදු වේ. සැලකිය යුතු ඇතැම් අවස්ථාවන්හි දී එය, හරි මාර්ගයේ බැරෑරුම් ලෙස ඉදිරියට ද ගොස් තිබේ." [36]

ට්‍රොට්ස්කිගේ සහ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ විසංවාදී ආස්ථානයන් සමාලෝචනය කිරීමේ දී, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිට මූලික ගැටලුව වී තිබුනේ සෝවියට් සංගමයේ සැලසුම්කරනය සහ කාර්මික සංවර්ධනය බව දැක ගත හැකි ය. කෙසේ වුවත් ට්‍රොට්ස්කිට නම් මෙම කාරනා පුලුල් ඉදිරි දර්ශනයක — එනම් ලෝක සමාජවාදී විප්ලවයේ වර්ධනයෙහි — කොටසක් විය. ඒ අනුව ගත් විට, නිලධරයේ "වමට" හැරීම, චීනයෙහි පරාජයට මග පාදමින් කොමින්ටර්නය තුල එය පවත්වා ගෙන ගිය විනාශකාරී ප්‍රතිපත්තිවලින් හෝ පක්ෂ තන්ත්‍රය පිලිබඳ ප්‍රශ්නයෙන් වෙන් කල නොහැකි විය.

ට්‍රොට්ස්කිට අනුව පක්ෂ තන්ත්‍රය පිලිබඳ ප්‍රශ්නය, කාර්මීකරනය සහ සමාජවාදී සංවර්ධනය පිලිබඳ ප්‍රශ්නයෙන් වෙන් කල නොහැකි විය. නිලධාරීවාදී මාවතකින් සහ පරිපාලන නියෝගවලින් සමාජවාදය ගොඩ නැගිය නොහැකි බවත් එය කල හැකි වන්නේ ජනතාවගේ මූලිකත්වයෙන් ද, අධිෂ්ඨානය සහ ජනතාවගේ අදහස් හරහා පමනක් බවත් 1925 ජූනියේ දී ඔහු අවධාරනය කලේ ය. "නිලධාරීවාදය සමාජවාදයේ මාරක හතුරෙකු වන්නේ එබැවිනි. ... සමාජවාදය ගොඩ නැගීම කල හැකි වන්නේ අව්‍යාජ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයත් සමග පමනකි." [37]

ට්‍රොට්ස්කි සමාජවාදී වූ සමුච්චයකරන "නියාමය" ගැන සඳහන් කලේ ඉඳ හිට නමුත්, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිට එයින් අර්ථවත් වූයේ කිසි යම් වෙනස් දෙයකි. සමාජයේ ආර්ථික සංවිධානය විසින් සවිඥ්ඥානකව භාර නොගන්නා කොන්දේසි යටතේ, වෛෂයික සංවර්ධන ප්‍රවනතාවක් ලෙස, ධනවාදී සමාජය තුල දී වටිනාකම පිලිබඳ නියාමය ක්‍රියාත්මක වේ. එහෙත් සමාජවාදී වූ සමුච්ඡයකරන "නියාමය" ගැන එය ම කිව නොහැකි ය. — එය හුදෙක් එය විසින් ම රාජ්‍යයේ ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවන්නන් වෙත පැටවෙන්නේ නැත. සත්තකින් ම, තීරන ගැනීමේ දී පදනම් කර ගත යුතු වෛෂයික බැඳීම් හා සම්බන්ධතා පවතින මුත්, ගන්නා ලද තීරන මත රුඳෙමින් මතුව එනු ඇත්තේ බෙහෙවින් වෙනස් ප්‍රතිඵල ය.

වැඩවසම්වාදී සීමා බන්ධන වලින් නිදහස් වීමත් සමඟ, අනෙකුත් සාමාජීය ආකෘතීන් බාදනය කරමින් සහ ඒවාට යටින් වල කපමින්, ධනේශ්වර වෙලෙඳ පොල සබඳතා ස්වයංසිද්ධව වර්ධනය වෙයි. සමාජවාදී සබඳතාවල දී මෙය මුලුමනින් ම වෙනස් ය. විභවයන් පවතින කොන්දේසි යටතේ දී ඒවා සවිඥ්ඥානකව වර්ධනය කිරීමට සිදු වේ, වැරදි ප්‍රතිපත්ති අනුගමනය කල හොත් සිදු වනු ඇත්තේ ආ පස්සට යාමකි.

ස්ටැලින්වාදී තන්ත්‍රය සිය "වමට" හැරීම ආරම්භ කලේ, ආර්ථිකය තුල හට ගත් අර්බුදය නිසා තමන් අනතුරට පත්ව ඇතැයි එයට හැඟී ගිය නිසා ය — වෛෂයික කොන්දේසි මඟින් එයට එසේ ක්‍රියා කිරීමට බල කලේ ය. එහෙත් එය ගනු ලැබූ පියවරයන්ගෙන් — බලාත්කාරී සාමූහිකරනයෙන් සහ ගම්බද ප්‍රදේශ සිවිල් යුද්ධයක අද්දරටම ගෙන ඒමෙන් — නිර්මානය වූයේ, තමන් විසින් ප්‍රයෝජනයට නො ගත හොත්, අධිරාජ්‍යවාදීන්ට තත්ත්වය මැනවින් සිය වාසියට හරවා ගත හැකි තත්ත්වයකි.

ට්‍රොට්ස්කි සහ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි අතර පැවතියේ, කිසි සේත් ඓතිහාසික උත්සුකතාවෙන් හටගත් මතභේදයන් ම නොවේ. මෙම ප්‍රශ්නය පිලිබඳව කෙරෙන පරීක්ෂාවක්, සෝවියට් සංගමයේ බිඳ වැටීමට යටින් පැවති හේතු සාධක එලිදරව් කර ගැනීමටත්, අනාගතය සඳහා සමාජවාදී ඉදිරි දර්ශනය හෙලිපෙහෙලි කර ගැනීමටත් උදව් වේ.

අප දුටු පරිදි, ප්‍රියෝබෙෂෙන්ස්කි සිය විශ්ලේෂනය පදනම් කලේ, වටිනාකම පිලිබඳ නියාමය කෙරෙහි ඒකාධිකාරී ධනවාදයෙන් එල්ල කෙරෙන බලපෑම මත ය. ඔහු මෙසේ ලිවී යː සෝවියට් සංගමය තුල ස්ථාපිත වූ රාජ්‍ය ආර්ථිකය වනාහි, "ඓතිහාසිකව ගත් කල ධනවාදයේ ඒකාධිකාරී ප්‍රවනතා අඛන්ඩව පැවතී ගෙන යාමක් ද තීව්‍ර වීමක් ද විය. එමෙන් ම එය, වෙලඳ භාන්ඩ ආර්ථිකය තව දුරටත් පරිහානියට පත් වීමේ හා වටිනාකම පිලිබඳ නියාමය තව දුරටත්

දිය වී යාම දෙසට මෙම ප්‍රවනතා අඛන්ඩව ගමන් කිරීමක් ද විය. ලෙනින්ගේ ප්‍රකාශය පරිදි, ඒකාධිකාරී ධනවාදයේ අවධිය තුල දැනට මත් භාන්ඩ ආර්ථිකයට 'යටින් වල කැපී' තිබින, එසේ නම් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ ආර්ථික ක්‍රමය තුල දී එයට ද එහි නියාමවලට ද — සහ එහි ප්‍රතිවිපාකයක් වශයෙන්, වටිනාකම පිලිබඳ එහි මූලික නියාමයට ද — යටින් වල කැපී ඇත්තේ කොතක් දුරට ද?" [38]

වෙනත් වචනවලින් කිව හොත්, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි සිය ඉදිරි දර්ශනය පදනම් කලේ ධනවාදී වර්ධනයේ එක්තරා ඓතිහාසික ආකෘතියක් මත ය — එනම් ජාතිකව පදනම් වූ ඒකාධිකාරයන්ගේ සහ සංගතයන්ගේ නැගීම මත ය.

කෙසේ වෙතත් ට්‍රොට්ස්කි පදනම් වූයේ, වඩා මූලික ක්‍රියා දාමයන් මත ය, සියල්ලට මත් වඩා, ධනේශ්වර ජාතික ආර්ථික පද්ධතියේ සීමාබන්ධන වලට උඩින් පැන යාමට හෝ ඒවා තුලින් ගමන් කිරීමට නිෂ්පාදන බලවේග තුල නිසගයෙන්ම පවතින තල්ලුව මත ය. ට්‍රොට්ස්කිට ජාත්‍යන්තරවාදය යනු වියුක්ත මූලධර්මයක් නො වී ය, රිචඩ් ඩේ නිවැරදිව අවධාරනය කරන පරිදි එය, "ආර්ථික ඉතිහාසයේ වෛෂයික ගමනේ ආත්මීය පිලිබිඹුව" විය. [39]

කෙසේ වෙතත්, ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි හඳුනා ගෙන තිබූ ප්‍රවනතා , ලෝක ආර්ථිකය තුල ජාතිකව පදනම් වූ ඒකාධිකාරී සංගත ආධිපත්‍යය දැරූ තාක් දුරට, සැලකිය යුතු කාලයක් තිස්සේ ක්‍රියාත්මක විය. තනි රටක සමාජවාදය පිලිබඳ ක්‍රියා මාර්ගයට අනුව, යෝධ ආර්ථික බාරකාරත්වයක විලාසයෙන් ක්‍රියාත්මක වෙමින්, කිසි යම් ප්‍රමානයක ස්ථාවරත්වයක් අත් කර ගන්නට සෝවියට් සංගමයට හැකි විය. යුක්ති සහගත භාවයකින් තොරවම නොවූවත්, කියා ඇති පරිදි, ජෙනරල් මෝටර්ස් සමාගම පශ්චාත් යුද්ධ ආර්ථික උත්පාත සමය තුල එක්සත් ජනපදයේ "ජාතික ප්‍රමුඛයා" ලෙස ක්‍රියාත්මක වෙද්දී එහි අභ්‍යන්තර මෙහෙයුම් සිදු වූ අයුරුත්, සෝවියට් සංගමයේ ක්‍රියාකාරිත්වයත් අතර එතරම් ම වෙනසක් නොතිබින.

ජාතිකව පදනම්වූ ඒකාධිකාරී ධනවාදයේ, සංවර්ධනයට මග පෑදූ ක්‍රියා දාමයන් ඉතා බලගතු විය. එහෙත් වටිනාකම පිලිබඳ නියාමය සිය අවසන් වචනය දී නොතිබුනි. අප දන්නා පරිදි, අවසන් විග්‍රහයේ දී සාමාන්‍ය ලාභ අනුපාතිකය තීරනය වන්නේ වටිනාකම පිලිබඳ නියාමයෙනි. ලාභ අනුපාතිකය පහත නොවැටුනු තාක් දුරට ජාතිකව පාදක ඒකාධිකාරී ධනවාදයට — ජාතික ප්‍රමුඛයන්ගේ තන්ත්‍රයට — අඛන්ඩව ක්‍රියාත්මක විය හැකි විය. එහෙත්, 1970 ගනන්වල මැද භාගය වන විට ලාභ අනුපාතිකය තියුනු ලෙස පිරිහී තිබින. මෙය ධනේශ්වර නිෂ්පාදන විධිය තුල, ලෝක පරිමාන මූලික ප්‍රතිසංවිධානයක් ඇති වීමට මග පෑදී ය. ජාතික සීමාවන් සහ දේශසීමා හරහා නිෂ්පාදනය විසුරුවා හැරීමේ පදනම මත ක්‍රියාත්මක වූ ගෝලීකරන ක්‍රියා දාමයෝ, නව ජාත්‍යන්තර ශ්‍රම විභජනයකට මග පෑදූහ. ඒවා සෝවියට් සංගමයේ ද අනෙකුත් ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ ද ජාතිකව පාදක රාජ්‍ය ආර්ථිකයන් දුස්සාධ්‍ය තත්ත්වයට පත් කලහ. සෝවියට් සංගමයේ රාජ්‍ය ආර්ථිකය වනාහි ඒකාධිකාරී ධනවාදී ප්‍රවනතාවන් අඛන්ඩව ක්‍රියාත්මක වීමක් යැයි ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි දිගටම කියා සිටියේ ය. එහෙත් ඒ ප්‍රවනතාවන්ගේ ඓතිහාසික සීමාසහිතකම ඔප්පු වන්නට නියමිතව තිබින.

අවසන් විග්‍රහයේ දී — පරාජය කර තිබිනැයි ඔහු කියා සිටි — වටිනාකම පිලිබඳ නියාමයේ ක්‍රියාකාරිත්වය නිසා හැඩ ගැසී ආ නව ජාත්‍යන්තර ශ්‍රම විභජනය, සෝවියට් ආර්ථිකය තුල අර්බුදයක් හට ගැන්වී ය. මෙම අර්බුදය පහලින් මතු වී එන ව්‍යාපාරයකට මග පාදනු ඇතැයි යන බියෙන් යුතුව, 1920 ගනන්වල දී ට්‍රොට්ස්කිට සහ වාම විරුද්ධ පාර්ශ්වයට පහර දෙමින් ඇරඹූ ගමන පරිසමාප්තියට පත් කල ස්ටැලින්වාදී නිලධරය, ධනවාදය පුනස්ථාපනය කිරීමේ වැඩ කටයුතු සංවිධානය කලේ ය.

ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කිගේ විශ්ලේෂනයට අනුව වඩාත් ම මූලික ප්‍රශ්නය වූයේ ඒකාධිකාරය වර්ධනය වීම යි — එනම් කම්කරු පන්තියෙන් මිරිකා ගත් අතිරික්ත වටිනාකම අයත් කර ගැනීමට කරන අරගලයේ දී ප්‍රාග්ධනයේ විවිධ අංශ අතර පැවති සබඳතාවල ඇති වූ වෙනස යි. ට්‍රොට්ස්කිට අනුව පදනම්වලත් පදනම වූයේ — දේපොල හෝ වෙලෙඳ පොල ආකෘතියට වඩා මූලික කාරනය වූයේ — නිෂ්පාදන බලවේගවල භූගෝලීය පරිමාන තල්ලුව යි.

මෙහි දී ගෝලීය නිෂ්පාදනයෙන් සමන්විත වර්තමාන යුගය තුල, සමාජවාදී ඉදිරි දර්ශනය වර්ධනය කිරීම පිලිබඳ කාරනයේදී, ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනයෙහි සමීප අර්ථභාරයක් ගැබ් වෙයි. කම්කරු පන්තියට ලෝකය පුරා එක වර හෝ අඩු ගනනේ රටවල් කිහිපයක එක වර බලය ගත හැකිය යන්නෙන් අර්ථවත් කරන්නේ, ලෝක ආර්ථිකයේ මෙම නව ව්‍යුහය නො වේ ද?

එසේ නොවන්නේ නම්, පහත සඳහන් ප්‍රශ්නය පැන නගියිඃ නිෂ්පාදනය විසිරී ගිය ස්වභාවයක් අත් කර ගෙන ඇත් නම්, අද දවසේ වෙලඳ භාන්ඩ සියල්ලක් ම පාහේ නිෂ්පාදනය කෙරෙන්නේ සියලු මහාද්වීප සහ කාලය අනුව වෙනස්වන කලාප හරහා විහිදී ගිය ක්‍රියා දාමයන් හරහා නම් සහ එය තනි ජාතික රාජ්‍යයක සීමාවන් තුල සිදු කල නොහැකි නම්, තනි රටක් තුල

බලය ගත් කම්කරු පන්තියකට සමාජවාදී විප්ලවය වෙනත් රටවලට පැතිරී යන තෙක් ගත වන කාලය තුල දී සිය ආර්ථිකය තිරසරව පවත්වා ගෙන යා හැකි වන්නේ කෙසේ ද? වෙනත් වචනවලින් කිව හොත්, නිෂ්පාදනයේ ගෝලීයකරනය "තනි රටක සමාජවාදය" පිලිබඳ ක්‍රියා මාර්ගය මත පදනම් වූ තන්ත්‍රයන්ගේ මල බෙරය හඬවා ඇති තතු යටතේ, දේශපාලන බලය ගැනීම සහ පවත්වා ගෙන යාම මත් කල නොහැකි දෙයක් බවට පත්ව නැත්තේ ද?

එය එසේ වනු ඇත්තේ, ජාත්‍යන්තර ශ්‍රම විභජනයේ වෛෂයික අර්ථභාරය නො සලකා හැරිය හොත් පමනකි. ට්‍රොට්ස්කි අවධාරනය කල පරිදි, මෙය දිග හැරෙන්නේ දෘෂ්ටිවාදයේ සහ දේපොලවල රූපාකාරයන් සැලකිල්ලට ගනිමින් නො වේ, නිෂ්පාදන බලවේගවල — පදනම්වලත් පදනමෙහි — සිදු වන මූලික වෙනස් වීම් පදනම් කර ගනිමිනි. ධනේශ්වරය, එය රුසියානු විප්ලවයට මුහුන දුන් රුදුරු භාවයෙන් ම යුතුව, ලොව ඕනෑ ම කොටසක සිදු වන සාර්ථක සමාජවාදී විප්ලවයකට සුබ පැතුම් පිරිනමනු ඇති බවට කිසිදු සැකයක් නැත.

එහෙත් නිෂ්පාදනයේ ගෝලීය ස්වභාවයෙන් අර්ථවත් වන්නේ, වර්තමාන යුගයේ දී ස්ථාපනය කෙරෙන කම්කරු රාජ්‍යයක් හුදෙකලා කිරීමට හෝ කොටු කිරීමට දරන ඕනෑ ම ප්‍රයත්නයකින්, ලෝක ධනවාදී ආර්ථිකයට ඉතා බැරෑරුම් ප්‍රතිවිපාක අත් වනු ඇති බව යි. චීනය සහ එක්සත් ජනපදය අතර පවතින සබඳතාව ගැන නිකමට සලකා බලන්න.

ඊට අමතරව, භූගෝලීයකරනයේ ගාමක බලවේගය බවට පත්ව ඇති වෙලෙඳ පොල සහ ලාභය සඳහා වන රුදුරු තරගකාරී අරගලයෙන්, සමාජවාදී විප්ලවය ජාත්‍යන්තරව වර්ධනය වන තෙක්, ප්‍රතිමල්ලව ධනවාදී බලයන් අතර පැද්දෙමින් උපාමාරු දැමීමේ අවස්ථාවන් ද අලුතින් ස්ථාපනය වන කම්කරු රාජ්‍යයකට සම්පාදනය වනු ඇත.

සියල්ලටත් වඩා, මින් පෙර කිසි දා ලඟා නොවූ පරිමානයකට ජාත්‍යන්තර කම්කරු පන්තියේ වෛෂයික එකමුතුකම පත්නර ගත්වා ඇති නිෂ්පාදනයේ භූගෝලීයකෘත ස්වභාවයේ ම අර්ථය වන්නේ, සමාජවාදී විප්ලවය ද ගෝලීය දේශපාලන ව්‍යාපාරයක රූපාකාරය අත් කර ගනු ඇති බව යි, නිෂ්පාදන බලවේග මෙන්ම එය ද කාලය අනුව වෙනස්වන කලාප, ජාතික සීමාවන් සහ මහාද්වීප හරහා වේගයෙන් පැන යනු ඇති බව යි.

*සමාප්තයි*

**සටහන්:**


24. E. Preobrazhensky, *The New Economics*, (ඊ. ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි, "නවීන අර්ථශාස්ත්‍රය"), Clarendon Press, 1965, 3 පි.

25. Preobrazhensky, 84 පි.

26. Preobrazhensky, *The Crisis of Soviet Industrialisation*, (ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි, "සෝවියට් කාර්මීකරනයේ අර්බුදය"), Donald A. Filtzer සංස්., 62 පි.

27. Preobrazhensky, *The New Economics*, 58 පි.

28. Preobrazhensky, *The New Economics*, 111 පි.

29. Preobrazhensky, *The New Economics*, 140 පි.

30. Preobrazhensky, *The New Economics*, 152 පි.

31. Trotsky, *Challenge of the Left Opposition 1926-27*, (ට්‍රොට්ස්කි, "1926-27 වාම විරුද්ධ පාර්ශ්වයේ අභියෝගය"), 57-58 පිටු.

32. Day, 147 පි.

33. Preobrazhensky, *The New Economics*, 65 පි.

34. Preobrazhensky, *The New Economics*, 178 පි.

35. Day, 132 පි.

36. Daniels, 374 පි.

37. Day, 142 පි.

38. Preobrazhensky, *The New Economics*, 141 පි.

39. Day, "Trotsky and Preobrazhensky," in: *Studies in Comparative Communism,* (ඩේ, "තුලනාත්මක කොමියුනිස්ට්වාදය පිලිබඳ අධ්‍යයන" නමැති කෘතියෙහි එන "ට්‍රොට්ස්කි සහ ප්‍රියෝබ්‍රෙෂෙන්ස්කි"), 1977.


© www.wsws.org